# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

| විෂයය අංකය பாட இலக்கம் | 21 | විෂයය பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 | 31. | 3 |
| 02. | 1 | 12. | 4 | 22. | 3 | 32. | 1 |
| 03. | 4 | 13. | 2 | 23. | 2 | 33. | 3 |
| 04. | 2 | 14. | 1 | 24. | 4 | 34. | 1 |
| 05. | 1 | 15. | 3 | 25. | 1 | 35. | 2 |
| 06. | 3 | 16. | 1 | 26. | 3 | 36. | 4 |
| 07. | ALL | 17. | 3 | 27. | 2 | 37. | 1 |
| 08. | 4 | 18. | 1 | 28. | 4 | 38. | 4 |
| 09. | 2 | 19. | 3 | 29. | 2 | 39. | 3 |
| 10. | 1 | 20. | 4 | 30. | 1 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 40 = 40

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 25/40 | I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25/40 |
|---|---|---|---|

7 ප්‍රශ්නය සඳහා කවර පිළිතුරක් සඳහන් කර තිබුණ ද, සඳහන් කර නොතිබුණ ද ලකුණු ලබා දෙන්න.

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# II පත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.

"ශිෂ්‍යාවන්ගේ ප්‍රාසාංගික ඉදිරිපත් කිරීම සියලු රසිකයන්ගේ අවදානයට ලක් විය."

(ii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.
(අ) පසිඳුරන් (ආ) අත්‍යුදාර

(iii) පහත සඳහන් වාක්‍යවල ඇතුළත් තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියාපද වර්ගය ලියන්න.
(අ) ගුරුවරයා ශිෂ්‍යයා ලවා රචනාවක් **ලියවයි.**
(ආ) ඔහු මා වෙත **පැමිණ** සුබ පැතුවේ ය.

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් **නිපාත පද දෙකක්** උපුටා ලියන්න.
"එම වාක්‍යය සියලු දෙනාට එක සේ තේරුම් ගත හැකි පරිදි ලියා ඇත."

(v) පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේදය ලියන්න.
(අ) අනුබල (ආ) මලවී

(vi) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) ශිෂ්‍යයෝ සමග ගුරුවරු ද ප්‍රේක්ෂකාගාරයට ඇතුළු වූහ.
(ආ) අපි සත්‍යගරුක මිනිසුන් වෙමු.

(vii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) ස්වල්ප දෙයින් සෑහීමට පත්වීම
(ආ) කළගුණ නොසලකන

(viii) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හෝ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) අඳුන් පර්වතය (ආ) මිනිස් ශරීරය

(ix) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.
(අ) සරණ (ආ) සරන

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරකයට හරවා නැවත ලියන්න.
(අ) ප්‍රේක්ෂකයන් විසින් ක්‍රීඩකයෝ ඔල්වරසන් දී දිරිගන්වනු ලබති.
(ආ) ගුරුතුමිය විසින් කථික තරගයෙන් ජයග්‍රහණය කළ ශිෂ්‍යයෝ අගයනු ලැබූහ.

(ලකුණු 02 × 10 = 20 යි)

(i) ප්‍රාසංගික, අවධානයට

(ii) (අ) පස් + ඉඳුරන්

(ආ) අති + උදාර

(iii) (අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා / පියෙදු කිරිය

(ආ) පූර්ව ක්‍රියා / පෙර කිරිය

(iv) සේ, පරිදි

(v) (අ) අව්‍යය සමාසය / අවිය සමස්

(ආ) අන්‍යාර්ථ සමාසය / අන් අරුත් සමස්

(vi) (අ) ශිෂ්‍යයන් සමග ගුරුවරු ද ප්‍රේක්ෂකාගාරයට ඇතුළු වූහ.

(ආ) අපි සත්‍යගරුක මිනිස්සු වෙමු.

(vii) (අ) අල්පේච්ඡ / අපිස්

(ආ) අකෘතඥ / ගුණමකු

(viii) (අ) අඳුන් පව්ව

අඤ්ජන / අංජන පර්වතය

(ආ) මනුෂ්‍ය ශරීරය

මිනිස් සිරුර

(ix) (අ) සරණ - පිහිට, විවාහය, පාදය යන අර්ථය දෙයි.

(ආ) සරන - ඇවිදීම, සංචාරය යන අර්ථ දෙයි.

(x) (අ) ප්‍රේක්ෂකයෝ ක්‍රීඩකයන් ඔල්වරසන් දී දිරිගන්වති.

(ආ) ගුරුතුමිය කථික තරගයෙන් ජයග්‍රහණය කළ ශිෂ්‍යයන් අගය කළා ය / ඇගයුවා ය.

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය - විශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි අන්තර්ගත විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් අපේක්ෂකයා මාතෘකාව සකස් කර ගත යුතු ය.

**2.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250 කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** මිනිසා ඇතුළු සියලු ජීවීන්ට ජලය අත්‍යවශ්‍ය සාධකයකි. සාගර, මුහුදු, විල්, ගංගා, වැව් ආදි ජල මූලාශ්‍රයවල ඇති ජල ප්‍රමාණය ඉතා විශාල වුවත් මිනිසාගේ භාවිතය සඳහා ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය ඉතා අල්ප ය. වර්තමානය වන විට විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා ජල සම්පත විනාශ වෙමින් පවතී. මේ සඳහා ඉතා ඉක්මනින් නිසි පියවර නොගත හොත් මිනිසා ඇතුළු සියලු ජීවීන් නො සිතූ විරූ උපද්‍රවයකට පත් වීම වැළැක්විය නොහැකි වනු ඇත.

**(ආ)** පුරාවස්තු යනු ඕනෑ ම රටක අනන්‍යතාව පිළිබිඹු කෙරෙන, අතීත මිනිසුන්ගේ කලාත්මක පරිකල්පනය හා ශිල්පීය ඥානය පිළිබඳ වටහා ගත හැකි මිනුම් දණ්ඩකි. බොහෝ සංවර්ධිත රටවල මෙකී පුරාවස්තු සංරක්ෂණය කිරීම උදෙසා විශේෂිත වූ නෛතික ප්‍රඥප්ති මෙන් ම රාජ්‍ය මට්ටමේ මැදිහත්වීම් ද වේ. මෙරටෙහි ද ප්‍රකට ව මෙන් ම අප්‍රකට ව ද පවතින ආගමික, ඓතිහාසික සහ කලාත්මක වටිනාකමක් සහිත පුරාවස්තු සංරක්ෂණය කිරීමට රාජ්‍ය මට්ටමේ මැදිහත්වීම් හා නෛතික ක්‍රමෝපායයන් ශක්තිමත් කිරීම කඩිනම් කළ යුතු ව ඇත.

**(ඉ)** ආනයනය කළ තිරිඟු පිටිවලින් සැකසුණු ආහාර පරිභෝජනයට ශ්‍රී ලාංකිකයන් නැඹුරුවීමේ ප්‍රවණතාව මේ දිනවල ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. දිනපතා මිල ගණන් ඉහළ යාම නිසා පාරිභෝගිකයින් දුෂ්කරතාවට පත්වීම මෙන් ම බෝ නොවන රෝගවලට ජනතාව ගොදුරුවීම වැනි උග්‍ර සමාජ අර්බුද රැසක් ද මෙමගින් හට ගෙන තිබේ. දේශීය සහල්, සහල් පිටි හා අලබතලවලින් සැකසුණු ආහාර රටාවකට හුරුපුරුදු වීම ඉහත සඳහන් අර්බුදවලට ද විසඳුම් සැපයෙන මෙරට ආර්ථිකය ද ශක්තිමත් කෙරෙන වඩාත් ම සාධනීය ක්‍රමවේදය බව පෝෂණ විද්‍යාඥයින්ගේ මතය යි.

**(ඊ)** ගීතය අප අතර බෙහෙවින් ජනප්‍රිය සාහිත්‍යාංගයකි. පදරචකයාගේ ද සංගීතඥයාගේ ද ගායකයාගේ ද සුසංයෝගයෙන් බිහිවන ගීතය අප සිත් සතන් නිවාලයි; ආතතිය දුරලයි; විවේකය විනෝදයෙන් ගත කිරීමට ඉඩ සලසයි. අතීතයේ නිර්මාණය කරන ලද හරවත් ගීත අදත් අපගේ සිත් සතන් අමන්දානන්දයට පත් කරවයි. වර්තමානයේ ද ඉතා සුළු ප්‍රමාණයක් හරවත් ගීත අසන්නට ලැබුණ ද වැඩිපුර සවන්හි වැකෙන්නේ බොළඳ හරසුන් ගීත ය. මේ තත්ත්වය වෙනස් කිරීමට නිර්මාණකරුවන් ද උත්සාහ ගත යුතු ය. එසේ ම ශ්‍රාවකයා බුද්ධිමත් වීම ද අවශ්‍ය වේ.

(ලකුණු 25 යි)

(අ) ජල සම්පත රැක ගැනීමේ වැදගත්කම
අපට ජීවය දෙන ජල සම්පත

(ආ) පුරාවස්තු රැක ගැනීම අප සැමගේ වගකීමකි
අපේ අනන්‍යතාව පිළිබිඹු කරන පුරාවස්තු රැක ගැනීමේ අවශ්‍යතාව

(ඉ) දේශීය ආහාර පරිභෝජනයට හුරුවීමේ වැදගත්කම
නීරෝගීතාව සුරකින දේශීය ආහාර

(ඊ) සිත නිවන සුභාවිත ගීතය
හරවත් ගීත කලාවක අවශ්‍යතාව

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.**

01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි.
02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.

01. සාරවත්භාවය - ලකුණු 07 යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංග ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතු යි**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යූහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යූහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ හැකියාව ද මෙහි ලා විමසීමට ලක් කෙරේ.

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අපේ අධ්‍යාපනය සාහිත්‍යාදි ශාස්ත්‍රයනට ම සීමා වූයේ නො වේ. අපි ඒ හා සමාන පාරම්පරික කලා ශිල්පවලට ද හිමිකරුවෝ වමු. ආදියෙහි ලක්දිව පැවැති බොහෝ වූ කර්මාන්ත හා වෘත්ති හා පිළිබඳ පුවත් වංසකථාදි පාලි ග්‍රන්ථයන්හි ද සිංහල සාහිත්‍යයෙහි ද සඳහන් ව ඇත. අපේ පුරාණ පුරවරයන්හි අද දක්නා ලැබෙන නෂ්ටාවශේෂ ද, වියළි කලාපය පුරා විසිරී පවතින වැව් අමුණු සමූහය ද පුරාණ සිංහලයා දැන සිටි නිර්මාණ ශිල්පයට දෙස් දෙයි. මෑත කරන ලද පුරාවිද්‍යා කැණීම්වල දී හමු වුණ රන්, රිදී, තඹ ආදි ලෝහයෙන් තනන ලද ප්‍රතිමාදියෙන් ද, ඉතා කමනීය සේ නිමවන ලද ආභරණවලින් ද පුරාණ සිංහල කාර්මිකයාගේ දස්කම් අනාවරණය වේ. ආදි සිංහලයා පතල් කැණ ලෝපස් සොයා ගැනීමට ද, එය පවිත්‍ර කොට විවිධ ලෝහ වර්ග සකස් කර ගැනීමට ද දැන සිටියේ ය; ලීයෙන් මෙන් ම ගලින් ද කැටයම් කිරීමට දැන සිටියේ ය; රන් රිදී මුතු මැණික් ආදියෙන් පලඳනා සෑදීමට දැන සිටියේ ය; මැටියෙන් ද ලෝහයෙන් ද, ඔප දැමූ ද නො දැමූ ද බඳුන් සෑදීමට දැන සිටියේ ය; එ පමණක් ද නො වේ. මහ සයුර පරයන පරාක්‍රම සමුද්‍රය බඳු වැව්, මහ ගංගා පරයන යෝධ ඇළ වැනි වාරිමාර්ග ආදිය ඉදි කිරීමට අවශ්‍ය වූ ශිල්ප ඥානය ද, සුවිසල් සත්මහල් ප්‍රාසාද සහ වලා පැටලෙන කොත් කැරැල්ලෙන් හෙබියා වූ දාගැප් ඉදි කිරීමට අවශ්‍ය වූ නිර්මාණ ශිල්ප ඥානය ද අපේ මුතුන්මිත්තන් සතු ව තිබිණි.

(ලකුණු 10 යි)

**සාරාංශකරණය :**

**අන්තර්ගතය**

(i) අපේ අධ්‍යාපනය සාහිත්‍යාදි ශාස්ත්‍රවලට හා කලා ශිල්පවලට හිමිකම් කියයි.

(ii) ලක්දිව පැවති කර්මාන්ත හා වෘත්ති පිළිබඳ ව පැරණි පොතපතෙහි සඳහන් වෙයි.

(iii) අපේ පැරණි නගරවල නටබුන් සහ වැව් අමුණු සමූහය අතීත ජනතාවගේ නිර්මාණ ශිල්පයට සාක්ෂ්‍ය සපයයි.

(iv) ලෝහ, දැව, ගල්, මැටි, තඹ හා මුතු මැණික්වලින් තැනූ නිර්මාණ මගින් පුරාණ සිංහලයාගේ ශිල්පීය දක්ෂතා අනාවරණය වෙයි.

(v) මහ වැව්, යෝධ ඇළ වැනි වාරිමාර්ග, සුවිශාල ප්‍රාසාද හා මහ දාගැබ් ඉදි කිරීමේ ශිල්පඥානය ද අපගේ මුතුන් මිත්තන් සතු විය.

**සාරාංශකරණය:**

**මුළු ලකුණු ප්‍රමාණය 10 යි.**

**ලකුණු විග්‍රහය:**

01. අන්තර්ගතය - ලකුණු 06 යි.

02. වචන ගණන - ලකුණු 02 යි.

03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි.

★ වචන ගණන 80 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.

★ වචන ගණන 60ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.

★ ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.

★ එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණ 02කි.

★ වචන ගණන 80ට වැඩි කල්හි හෝ 60ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.

★ දුර්වල සාරාංශ සඳහා බිංදුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

**ප්‍රශ්න අංකය 04**

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධය පිළිබඳ හැකියාව මැනීම

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

සිංහලයෝ ද්වීපවාසීහු ය. එහෙයින් ඉතා ඈත අතීතයේ පටන් ම ඔවුන් මුහුදු ගමන්වල ද, නැව් තැනීමෙහි ද නියුක්ත වූවා විය යුතු ය. එහෙත් මේ දෙකරුණ සඳහා ම ලංකා ඉතිහාසයේ පූර්ව යුගයෙන් ලැබෙන උදාහරණ ඉතා ම දුර්ලභ ය. ක්‍රිස්තු වර්ෂාරම්භයට පෙර පැවති දියුණු මුහුදු වෙළෙඳාමෙහි කේන්ද්‍රස්ථානය වූ ලංකාවෙහි සිංහලයෝත් එම වෙළෙඳාමෙහි නියුක්ත වූවාහු ද නැතහොත් චීන සහ මැද පෙරදිග වෙළෙඳුනට තොටු පහසුකම් සැලසුවාහු ද යනු අපට දැනට ලැබී තිබෙන කරුණු අනුව නිගමනය කිරීම අපහසු ය. නාවික කටයුතු පිළිබඳ ඉතා ම විශ්වාසදායී කරුණු අපට ලැබෙන්නේ අනුරාධපුර යුගයේ අවසාන සියවස්හි දී ය. ඒ කාලයේ දී දකුණු ඉන්දියා කටයුතුවලට මැදිහත් වන්නට සිදු වූ නිසා සිංහල රජුනට සෑහෙන නැව් හමුදාවක් අවශ්‍ය විය.

ලංකාව දකුණු ආසියාකරයේ නාවික බලයක් බවට පත් වූයේ මහ පැරකුම්බා රජු දවස ය. වාර්තාගත ව ඇති, ඉන්දියාවටත්, බුරුමයටත් යාත්‍රා කළ නාවික ගමන් හැර අසල්වැසි රටවල් හා ලංකාව අතර වඩා සාමකාමී නැව් ගමනාගමනයක් ද තිබුණා විය යුතු ය. මාලදිවයින් වාසීන්ගේ සංස්කෘතියෙහි සහ භාෂාවෙහි සිංහල ලක්ෂණ පැහැදිලි ව දක්නට ලැබීමෙන් ද, ඔවුන් විසින් ම සඳහන් කරනු ලබන ඔවුන්ගේ ඉතිහාසයෙහි ආරම්භයෙන් ද හෙළිවන්නේ සිංහලයන් ලක් වෙරළින් ඔබ්බෙහි නව පෙදෙස් යටත් කොට ජනාවාස කිරීමට පෙලඹුණු බව යි.

සිංහලයන්ගේ නැව් තැනීමෙහි ප්‍රධාන කාර්මික ලක්ෂණයක් වූයේ ලෝහ ඇණ කිසිවක් භාවිත නොකිරීම යි. ඔවුහු නැව් තැනීමේ දී ලෑලි එකට සවි කිරීම සඳහා ලී ඇණත් එකට බැඳීම සඳහා පොල් කෙඳිවලින් තනා ගත් කඹත් භාවිත කළහ.

(i) ක්‍රිස්තු වර්ෂාරම්භයට පෙර පැවති දියුණු මුහුදු වෙළෙඳාමෙහි කේන්ද්‍රස්ථානය වූ රට වශයෙන් ලේඛකයා හඳුන්වන්නේ කුමක් ද?

(ii) නාවික කටයුතු පිළිබඳ ඉතා ම විශ්වාසදායී කරුණු ලැබෙන්නේ කවර කාලයේ දී ද?

(iii) සිංහලයින් ලක් වෙරළින් ඔබ්බට නව ප්‍රදේශ යටත් කර ගෙන ජනාවාස ඉදිකළ බවට සාක්ෂි වශයෙන් මෙහි දැක්වෙන රට කුමක් ද?

(iv) මේ ඡේදයෙහි සඳහන් වන ආකාරයට නැව් තැනීමේ දී සිංහලයන් සතු වූ ප්‍රධාන කාර්මික ලක්ෂණය කුමක් ද?

(v) නැව් නිෂ්පාදනයේ දී ලෑලි එකට සවිකිරීමට සිංහලයන් යොදා ගත්තේ මොනවා ද?

(ලකුණු 02 × 5 = 10 යි)

(i) ලංකාව

(ii) අනුරාධපුර යුගයේ අවසාන සියවස්වල

(iii) මාලදිවයින

(iv) ලෝහ ඇණ භාවිත නොකිරීම / ලෝහ ඇණ වෙනුවට ලී ඇණ භාවිත කිරීම

(v) ලී ඇණ

**ප්‍රශ්න අංකය 05**
**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම

**5.** පහත දැක්වෙන විස්තරය පදනම් කරගෙන **රාජකාරි ලිපියක්** ලියන්න.

සඳසිරිගම පාසලට ක්‍රීඩා පිටියක් නොමැත. ප්‍රදේශයේ පැරණි බස් නැවතුම්පොළ පිහිටි ස්ථානය ඒ සඳහා වඩාත් සුදුසු වේ. එය දැනට වල් බිහි වී ඇතත් පහසුවෙන් ක්‍රීඩා පිටියක් බවට පත් කිරීමේ හැකියාව ඇත. සඳසිරිගම පාසලේ ආදි ශිෂ්‍ය සංගමය මේ සඳහා දැඩි උනන්දුවක් දක්වයි. ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් විකුම් සෙනවිරත්න ඔබ යැයි සිතා, ක්‍රීඩා පිටිය සඳහා පැරණි බස් නැවතුම්පොළ පිහිටි ස්ථානය වෙන් කර දීමට කටයුතු කරන ලෙස සඳසිරිගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් කරන ඉල්ලීම.

**නැතහොත්**

පහත දැක්වෙන විස්තරය පදනම් කරගෙන **ආරාධනා පත්‍රයක්** සකස් කරන්න.

සඳසිරිගම පාසලේ සංවත්සර උත්සවය පසුගියදා පැවැත්විණි. එහි දී 2020 මාර්තු මස 4 දින අත්කම් භාණ්ඩ ප්‍රදර්ශනයක් පැවැත්වීමට යෝජනාවක් සම්මත කර ගැනිණි. පෙ. ව. 10.00 සිට දවස පුරා පැවැත්වෙන මෙම ප්‍රදර්ශනය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් නිර්මාණය කරන ලද අත්කම් භාණ්ඩ තෝරා ගැනේ. ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා සඳසිරිගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට ආරාධනා කිරීමට තීරණය කෙරිණි. මේ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. ප්‍රදර්ශනය සඳහා සුදුසු නමක් ද යොදන්න.

(ලකුණු 15 යි)

**රාජකාරි ලිපිය**

| | | |
|---|---|---|
| 1. | ආකෘතිය | ලකුණු 05 යි. |
| 2. | අන්තර්ගතය | ලකුණු 07 යි. |
| 3. | ශිල්පීය දක්ෂතා | ලකුණු 03 යි. |
| | | මුළු ලකුණු 15 යි. |

**1. ආකෘතිය - ලකුණු 05 යි.**

| | |
|---|---|
| 1. යවන්නාගේ ලිපිනය | ලකුණු 01 යි. |
| 2. දිනය | ලකුණු 01 යි. |
| 3. ලබන්නාගේ ලිපිනය හා ආමන්ත්‍රණය | ලකුණු 01 යි. |
| 4. මාතෘකාව | ලකුණු 01 යි. |
| 5. අත්සන, නම හා තනතුර | ලකුණු 01 යි. |

**2. අන්තර්ගතය - ලකුණු 07 යි.**

1. ක්‍රීඩා පිටියක් නොමැති බව
2. ක්‍රීඩා පිටියක අවශ්‍යතාව
3. ක්‍රීඩා පිටියක් සඳහා සුදුසු ස්ථානයක් ඇති බව
4. එම ස්ථානය ක්‍රීඩා පිටියක් බවට පත් කිරීමට හැකියාවක් ඇති බව
5. ආදි ශිෂ්‍ය සංගමය මේ පිළිබඳ ව උනන්දු වන බව
6. ක්‍රීඩා පිටිය සඳහා පැරණි බස් නැවතුම්පොළ වෙන් කර දීමට අවශ්‍ය පියවර ගත යුතුබව
7. ඒ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් කරන ඉල්ලීම

**3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.
- ❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.

**නැතහොත්**

**ආරාධනා පත්‍රය**

1. ආකෘතිය - ලකුණු 06 යි.
2. අන්තර්ගතය - ලකුණු 06 යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

මුළු ලකුණු 15 යි.

**1. ආකෘතිය - ලකුණු 06 යි.**

1. මාතෘකාව - ලකුණු 01 යි.
2. නිර්මාණාත්මකභාවය - ලකුණු 02 යි.
   (මේ සඳහා විවිධ වර්ණ භාවිත කිරීමේ ඉඩ පවතී.)
3. ආරාධනය කරන්නා - ලකුණු 01 යි.
4. ආරාධිත දිනය - ලකුණු 01 යි.
5. ආරාධිත ස්ථානය / ලිපිනය - ලකුණු 01 යි.

**2. අන්තර්ගතය - ලකුණු 06 යි.**

1. ප්‍රදර්ශනයේ අරමුණ - ලකුණු 01 යි.
2. ප්‍රදර්ශනය පැවැත්වෙන දිනය - ලකුණු 01 යි.
3. ප්‍රදර්ශනය පැවැත්වෙන වේලාව - ලකුණු 01 යි.
4. ප්‍රදර්ශනය පැවැත්වෙන ස්ථානය - ලකුණු 01 යි.
5. ආරාධනය කුමක් සඳහා ද යන්න - ලකුණු 01 යි.
6. ආරාධනය ලබන්නා - ලකුණු 01 යි.

**3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ★ නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
- ★ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු 03කි.

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# III පත්‍රය

- ❖ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**
- ❖ **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි.**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) (අ) ජාතක කතා පොත සම්පාදනය සඳහා මූලාශ්‍රය කොට ගත් ග්‍රන්ථය කුමක් ද?
(ආ) ජාතක කතා පොත ඇසුරෙන් බිහි වී ඇති සිවුපද කාව්‍ය ග්‍රන්ථ **දෙකක** නම් ලියන්න.

(ii) ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද
.................................................
.................................................
(අ) මෙම කවියේ ඉතිරි පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම ජනකවිය කෙබඳු වර්ගයකට අයත් වේ ද?

(iii) "මා ගෙ ගෙහි කුමරෙක් උපන. උහු ගෙ අනුභාවයෙන් තොප ගෙ මතු නො වෙයි, සියලු නුවරැ ආයුධ දිළිණැ"
(අ) මෙහි සඳහන් කුමරුන්ගේ නම කුමක් ද?
(ආ) මෙම පාඨය උපුටා ගත් මුල් කෘතිය නම් කරන්න.

(iv) "පැසුණු ගොයම් මුල් වූවා සේ දුක් ගෙන උගත් ශිල්පය සිස් වී ය'යි සිතුහ."
(අ) මෙසේ සිතුවේ කවරෙක් ද?
(ආ) එසේ සිතන්නට හේතු වූ කරුණ කුමක් ද?

(v) (අ) ෂඩ් භාෂා පරමේශ්වර නමින් හැඳින් වූ යතිවරයාණන් වහන්සේ කවරෙක් ද?
(ආ) වීදාගම හිමියන් විසින් රචිත යැයි සැලකෙන හංස සන්දේශයට අමතර ව උන්වහන්සේ ලියූ ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

(vi) "එහෙනම් කුලී කාරයෙක් හොයා ගනිත්. මට බෑ කිව්වොත් බෑ."
(අ) කවරකු විසින් මෙම ප්‍රකාශය කරන ලද්දේ ද?
(ආ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(vii) "මොක ද දැන් ඔයාට වෙලා තියෙන්නේ? දැන් දවස් තුනක වෙලේ ඉඳන් ඔයා ටිකක් අමුතු විදියකට යි ඉන්නේ?"
(අ) මෙහි සඳහන් අයගේ අමුතු හැසිරීමට හේතුව කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම කුමක් ද?

(viii) "එව, පින්වත්නි, මියුලු නුවරට ගොස් වේදේහ රජ්ජුරුවන්ගේ ඉස තල්පැන් පලක් මඩනා සේ කඩුවෙන් කපා පියා දෙ පයින් මැඩ ගෙන හිඳ ජය පානය බොම්හ."
(අ) මෙහි පින්වත්නි යනුවෙන් ආමන්ත්‍රණය කරනුයේ කවුරුන්ට ද?
(ආ) මෙවැනි ප්‍රකාශයක් කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ix) මඟ නිලමින් සිටි නා දොඹ නී පියල
පිය සලමින් මලගෙහි කෙළ රොනින'වල
තතුඩ ලමින් බිඳු විලිකුන් මියුරු පල
**ඉසිඹු ලමින් යෙහි සැළ ! දඹ පඳුරුවල**
**(අ)** මෙම පද්‍යය උපුටා ගත් කෘතිය නම් කරන්න.
**(ආ)** තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස ලියන්න.

(x) දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය ඉදි කර දී මිස
යා නොහැකිය මට පුංචි පුතුන්
**(අ)** මෙම පද්‍යය ඇතුළත් නිර්මාණයේ රචකයාගේ නම කුමක් ද?
**(ආ)** පද්‍යයෙහි සඳහන් වන පරිදි කවියාගේ ප්‍රාර්ථනය කුමක් ද?

(ලකුණු 02 × 10 = 20 යි)

(i) (අ) පාලි ජාතකට්ඨ කථා

(ආ) කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍යය, සඳ කිඳුරු දා කව, කුස ජාතක කාව්‍යය, දහම් සොඬ දා කව, වෙස්සන්තර ජාතක කාව්‍යය, නිමි ජාතක කාව්‍යය, මුව ජාතක කාව්‍යය කව්මිණි කොඬොල, කව්මිණි මල්දම

(ii) (අ) වෙර නැති දා ගහ ගත්තේ දිනන්ට ද
යුද ඇති දා නැති කග කොස් කොටන්ට ද

(ආ) උපදේශ කාව්‍ය, උපදෙස් කවි, දැනමුතුකමට කී කවි

(iii) (අ) අහිංසක

(ආ) අමාවතුර

(iv) (අ) උග්ගසේන සිටු පුත්‍රයා

(ආ) උග්ගසේන සිටු පුත්‍රයා ක්‍රීඩා දක්කම් පෙන්වද්දී, රැස් වී සිටි පිරිස ඒ දෙස නො බලා බුදුන් වහන්සේ දෙස බලා සිටීම

(v) (අ) තොටගමුවේ ශ්‍රී රාහුල / සිරි රහල් හිමි

(ආ) බුදු ගුණ අලංකාරය, ලෝ වැඩ සඟරාව, දහම් ගැට මාලාව, එළු අත්තනගලු වංශය, කව් ලකුණු මිණිමල

(vi) (අ) අපට වැසිකිළියක් කෙටි කතාවේ කථකයා / හේරත්ගේ ලොකු පුතා

(ආ) අපට වැසිකිළියක් කෙටි කතාවේ අක්කා කුරහන් ඇඹරීමට මල්ලීට (කථකයාට) කතා කළ අවස්ථාවේ

(vii) (අ) දියමන්ති මාලය කෙටි කතාවේ මැටිල්ඩාට අධ්‍යාපන අමාත්‍යාංශ මන්දිරයේ පැවැත්වෙන උත්සවයට පැලඳ ගෙන යාමට කිසිදු ආභරණයක් නොමැති වීම

(ආ) මැටිල්ඩා, ලොයිසල් මැතිනිය, ලොයිසල්ගේ බිරිඳ, මැටිල්ඩා ලොයිසල්

(viii) (අ) එක් සියයක් රජ දරුවන්ට

(ආ) එක් සියයක් රජ දරුවන් මරනු පිණිස විෂ යොදා සකස් කරන ලද සුරාපානය මහෞෂධ පඬිතුමාගේ යෝධයන් විසින් විනාශ කරනු ලැබූ නිසා චූලනී බ්‍රහ්මදත්ත රජතුමා එයින් කෝපයට පත්වීම

(ix) (අ) සැළලිහිණි සන්දේශය

(ආ) සැළලිහිණිය, ජම්බු පඳුරුවල විවේක ගනිමින් යන්න.

(x) (අ) මහගමසේකර

(ආ) පුතු වෙනුවෙන් ලෝකය ඉදිකර දීම

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - 1. නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 20 යි. (එක් කොටසකට ලකුණු 04 බැගිනි.)**

(අ) කොටස ***ලකුණු 02 යි.***

(ආ) කොටස ***ලකුණු 02 යි.***

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) පන්සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන වෙණ නදයෙන් තොස්වූ
නන් **දන කැන්** දුටුව ද **බිය සිස්වූ**
මින් රළ'වුත් ගං වෙරළට රැස්වූ

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
**(ආ)** වීණා නාදයේ මිහිරි බව පැවසීමට කවියා යොදා ගෙන ඇති විස්මිත සිදුවීම කුමක්දැයි ලියන්න.

(ii) එකල්හි ගොන් රක්නාහු, වස්සන් රක්නාහු, සහන්නාහු, ගමන් යන්නාහු බුදුන් එකලා වැ බුදුරැස් නො විහිදැ වඩනුවන් දැකැ නො හැඳිනැ "මහණ එ මඟට නො යා. එ මඟැ අඟුල්මල් නම් සොරෙකැ, දරුණැ, ලෙහෙ මුඬු අත් ඇත්තෙ යැ,"

**(අ)** අඟුල්මල් නාමයෙන් මේ සොරා හැඳින්වූයේ ඇයි?
**(ආ)** මාර්ගයේ දී බුදුන් වළකාලීමට උත්සාහ කළෝ කවරහු ද?

(iii) අග පිපි මල් මලිගිය ලිය කැලේයා
**වග බැඳැ** හෙන රජ හස පුල් විලේයා
ළඟ තුරුමල් ගිලිහුණු **රොනවු'ලේයා**
මඟ බැස යව පළ හෙළ වැලි තෙලේයා

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
**(ආ)** මෙහි දැක්වෙන වැලි සහිත මාර්ගයෙහි ස්වරූපය කෙටියෙන් දක්වන්න.

(iv) ඔයිත් "තොප ගිය මැන, හුන මැනව. තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් දැ?"යි කියා ලා අවකප්පනයෙන් සැදූ හසු රැන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේ එ ම කිය කියා පුතු නළවයි.

**(අ)** මෙහි පුතු නළවන තැනැත්තිය සැමියා කෙරෙහි දැක්වූ ආකල්පය කෙබඳු ද?
**(ආ)** අවකප්පනයෙන් සැදූ හසු යන්නෙහි අදහස දක්වන්න.

(v) නිබඳ පැසී පල ලඹ දෙන මිහිර'ඹය
සුවඳ විහිද සිටි විලිකුන් කැන් රඹය
නොමඳ තැනින් තැන වලු බර වන රඹය
එමැද වෙහෙර දිලි දුරලන සසර බය

**(අ)** මෙහි සඳහන් වෙහෙරෙහි විශේෂත්වය කවියා දැක ඇත්තේ කෙසේ ද?
**(ආ)** මෙම කවියෙන් කියැවෙන වෙහෙර පිහිටි ප්‍රදේශයේ ස්වභාවය විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

(i) (අ) දන කැන් - ජන සමූහයා / ජනයා

බිය සිස්වූ - බියක් නැති ව / බිය නො වී / භය නැති ව

(ආ) නොයෙක් ජනයා රැස්ව සිටිය ද මත්ස්‍ය සමූහය ගංවෙරළට රැස්වීම /

මත්ස්‍ය සමූහයා ගංවෙරළට රැස්වීම / මත්ස්‍යයින් ගංවෙරළට රැස් වී සිටීම

(පද්‍යයෙන් නියමිත කොටස උපුටා දක්වා ඇත ද ලකුණු දෙන්න.)

(ii) (අ) ඇඟිලි මාලයක් කරේ දමා ගෙන සිටීම නිසා / මිනිසුන් මරා, ඔවුන්ගෙන් ඇඟිල්ල බැගින් කපා, ඒවා විද මාලයක් මෙන් පැලඳ සිටීම නිසා

(ආ) ගොනුන් රකින මිනිසුන්

වස්සන් රකින මිනිසුන්

සී සාන මිනිසුන්

ගමන් යන්නන් / මගීන්

(අදාළ පිළිතුර උපුටා දක්වා තිබුණ ද නිවැරදි සේ පිළිගන්න. මෙම කරුණුවලින් දෙකක් හෝ තුනක් ලියා ඇත්නම් ලකුණු 01 යි. එක් කරුණක් පමණක් තිබුණොත් ලකුණු හිමි නො වේ.)

(iii) (අ) වග බැඳැ - රංචු ගැසී / කණ්ඩායම් වී

රොන'වුලේයා - (මල්) රොන් / රේණු ගැවසී ගත් /, (මල්) රොනින් / රේණුවලින් ආකූල වූ

(ආ) ගස්වල මල්වලින් ගිලිහුණු රේණු ගැවසී ගත් පැහැදිලි / පැතිරුණු සුදු වැලි සහිත මාර්ගයකි. (කවියෙන් අදාළ කොටස පමණක් උපුටා දක්වා ඇත්නම් ලකුණු දෙන්න. කවිය උපුටා දක්වා ඇතොත් ලකුණු හිමි නො වේ. කවියේ අන්තර්ගත කරුණු 4 ම ලියා ඇතත් ලකුණු දෙන්න.)

(iv) (අ) කිසිවක් නොදන්නා ඔහුගෙන් (සැමියාගෙන්) තමාට කිසිම ප්‍රයෝජනයක් නැති බව

(ආ) වැරදි ලෙස පිළියෙල කළ අශ්වයා / වැරදි අයුරින් සූදානම් කළ අශ්වයා

(v) (අ) සංසාර භය දුරු කරන බව

(ආ) නිරන්තරයෙන් ම පැසී ගෙඩි එල්ලෙන මිහිරි (මධුර) අඹ ද සුවඳ විහිදුවන්නා වූ ඉදුණු කෙසෙල් කැන් ද අඩුවක් නැති ව තැනින් තැන වලුබර වූ වල් කෙසෙල් (වන කෙසෙල්) ද ඇති ප්‍රදේශයකි.

**ප්‍රශ්න අංකය 03**

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

**අපේක්ෂණය** - ඇගයීම, ප්‍රකාශනය, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම

**ලකුණු විග්‍රහය** - 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. - **ලකුණු 15 යි.**

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතු යි. - **ලකුණු 10 යි.**

**3.** (i) අර්ථයත්

(ii) ශබ්දයත්

මනා ලෙස සුසංයෝග කිරීම ගුත්තිල කාව්‍යය රසවත් නිර්මාණයක් වීමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින්

(i) කේවට්ට බමුණාගේ චරිතයත්

(ii) මහෞෂධ පඬිතුමාගේ චරිතයත්

උම්මග්ග ජාතකයේ නිරූපණය කර ඇති ආකාරය විමසන්න. (ලකුණු 15 යි)

03.

(i)+(ii) අර්ථ රසය මතු කිරීම සඳහා භාෂාව, උපමා රූපක, ව්‍යංග්‍යාර්ථ ආදි කරුණු පිළිබඳ ව අවධානය යොමු වූ කවි හා අනුප්‍රාසය, එළිවැට, විවිධ විරිත් භාවිතය ආදි ශබ්දාලංකාර මතු වන කවි නිදසුන් වශයෙන් දක්වා විස්තර කර තිබීම අපේක්ෂිත ය.

ඒ සඳහා පහත දැක්වෙන කවි නිදසුන් ලෙස යොදා විස්තරාත්මක ව ඉදිරිපත් කර ඇත්නම් ඉහළ ලකුණක් පිරිනමන්න.

රූ රසේ අදිනා ලෙසේ ....
පුන් මදාරා මල් දමින් මුදු ....
මන මත් කරවන දන මුළු දෙරණා ....
කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ ....

හා(ii) දිමුතු යසස් වන් කුසුම සරාගේ ....
දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි ....
පිය සත් නො ව බිගු දැල් රැඳි කොපුලී ....
දෙ වැනි තුන් වැනි තත ....

මීට අමතර ව වෙනත් අදාළ කවි නිදසුන් ලෙස දක්වා විස්තර කර තිබුණොත් නිවැරදි සේ පිළිගන්න.

**නැතහොත්**

**(i) කේවට්ට බමුණාගේ චරිතය :-**

- ★ අදූරදර්ශීභාවය
- ★ ආත්මාර්ථකාමිත්වය
- ★ අවස්ථාවාදීත්වය
- ★ නොපසුබස්නා උත්සාහය
- ★ තෘෂ්ණාව
- ★ උපක්‍රමශීලීභාවය

**(ii) මහෞෂධ චරිතය :-**

- ★ දූරදර්ශීභාවය
- ★ ස්ථානෝචිත ප්‍රඥාව
- ★ නිර්භීතභාවය
- ★ උපායශීලීභාවය
- ★ නායකත්වය

ආදි චරිත ලක්‍ෂණ අවස්ථා හා සිද්ධි ඇසුරින් නිදසුන් සහිත ව ලියා තිබීම අපේක්ෂිත ය. (උද්ධෘත දක්වා නැත ද නියමිත අවස්ථා හෝ සිද්ධි ඉස්මතු කර පෙන්වා දී ඇත්නම් අදාළ ලකුණු ප්‍රදානය කරන්න.)

**ප්‍රශ්න අංකය 04**

**4.** (i) භාෂාව සාර්ථක ව යොදා ගැනීමත්

(ii) යෝග්‍ය චරිත නිරූපණයත්

"අපට වැසිකිළියක් කෙටිකතාවේ" සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) කාව්‍යෝක්ති භාවිතයේත්

(ii) පරිසර වර්ණනයේත්

අපූර්වත්වය නිසා 'වස්සානය' පැදි පෙළ පාඨක සිත් ගනී. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

**(i) භාෂාව සාර්ථක ව යොදා ගැනීම :-**

- ★ සරල භාෂාව
- ★ ගැමි බස්වහර භාවිතය
- ★ සංවාදශීලී භාෂාව
- ★ සංකේත භාවිතය
- ★ උපමා භාවිතය
- ★ ඉඟි වැකි භාවිතය
- ★ ප්‍රස්තාව පිරුළු යොදා තිබීම

**(ii) චරිත නිරූපණය :-**

ඒ ඒ අවස්ථාවන්ට හා සිදුවීම්වලට අදාළ ව චරිත හැසිරෙන අයුරු විස්තර කර තිබීම අපේක්ෂිත ය.

- ★ පවුලේ අය ඉදිරියේ වීරයකු ලෙස හැසිරෙන තාත්තා රජයේ නිලධාරියා ඉදිරියේ බයාදු වීම
- ★ මිථ්‍යා විශ්වාසවල එල්බ සිටින මව
- ★ පවුලේ බර කරට ගෙන කටයුතු කරන එසේ ම මල්ලීට ආදරය කරන අක්කාගේ චරිතය
- ★ කථකයාගේ චරිතයේ විවිධ පැතිකඩ
- ★ අවබෝධයක් නැති, වැඩ මග හරින, ගම්මුන් ඉදිරියේ වීරයකු වන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ චරිතය
- ★ අවශේෂ අව්‍යාජ ගැමි චරිත හැසිරෙන ආකාරය

මේ ආදි කරුණු විස්තර සහිත ව ලියා තිබීම අපේක්ෂිත ය. උපුටා ගැනීම් අත්‍යවශ්‍ය නොවූවත් සුදුසු උදාහරණ ඉදිරිපත් කර තිබෙන විට ඉහළ ලකුණක් පිරිනමන්න.

**නැතහොත්**

**(i) අපූර්ව කාව්‍යෝක්ති භාවිතය නිසා 'වස්සානය' පැදි පෙළ පාඨක සිත් ගන්නා ආකාරය**

- ★ ''ඔය දෑල දොඩමලු ය, සුවඳ බැරුවා ඉන්ට''
- ★ ''කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට''
- ★ ''සෙනේහය පිරී ගිය ඔබෙ නයන නිල් පොකුණ''
- ★ ''තඹර පෙති අතර හෙල්මැලි රේණු වැසි වසින''
- ★ ''රැගෙන දෝතට පෙරා උණුහුමට හිරු එළිය''
- ★ ''කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස''

**(ii) අපූර්ව පරිසර වර්ණනා පාඨක සිත්ගන්නා ආකාරය**

- ★ ''කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන''
- ★ ''පුර පසේ සඳ එක්ක තරගයට මෝරන්ට''
- ★ ''දිය තිලන වැසි සමේ රැලි නගා උතුරා ය''
- ★ ''දෙවැට දිග කරඳවැල් ආරුක්කු යට සැඟව
  නිල් කුරුලු බිලිඳු නිදි - ඇහැරවන්නේ කුමට?''
- ★ ''රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
  සන්නාලියන් කොහොම ඇන්දා ද දේදුන්න?''
- ★ ''වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින''

මෙහි දක්වා ඇති උදාහරණවලට අමතර ව අදාළ පද්‍ය පාඨ ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

❖ **3, 4 පිළිතුරු සඳහා උදාහරණ 4ට ලකුණු 04 යි.**
**විස්තරයට ලකුණු ලකුණු 11 යි.**
**මුළු ලකුණු 15 යි.**

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**ප්‍රශ්න අංකය 05**

**5.** පරිසරයේ වෙනස් වීමත් සමග පිරිහී යන ගමක ස්වභාවය බැද්දේගම නවකතාවෙන් මනා ව නිරූපිත ය. නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**පරිසරයේ වෙනස් වීමත් සමග පිරිහී යන ගමක ස්වභාවය බැද්දේගම නවකතාවෙන් නිරූපණය වන ආකාරය.**

★ ''ක්‍රමයෙන් පිරිහී ගොස් අවටින් තෙරපා ගෙන එන මහ බැද්දට බත් වී යන වනගත කුඩා ගම්වලින් එකකි.''

★ ''එක පහරකට එක දවසකින් එහි තිබුණු ගෙවල් හයෙන් එකක් නැති විය.''

★ ''මුලින් ම වැට අද්දර කුඩා ගස් හා පඳුරු ඝනව වැඩී වැට යට කර ගත්තේ ය. දෙවනුව අළු පැහැති කොළ හා දම් පැහැති මල් ඇති වරා පඳුරු හා මානා පඳුරු ද දිග තියුණු කටු ඇති පතොක් පඳුරු ද වැට අද්දරින් රිංගා අවුත් මිදුලටත් ගෙයි බිත්තිවලට හා දොරකඩටත් ළං විය.''

★ ''තුන්වැනි වැස්ස අවසානයේ දී මුළු වත්තේත් ගෙයිත් කැලයේත් වෙනසක් නොපෑ ය.''

★ ''බිත්තිවල වරිච්චි කෝටු විශාල පඳුරු බවට වැඩුණේ ය.''

★ ''මේ ගම දැන් හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක් ගත් කාලකණ්ණි ගමකි ..................... එහි දැන් ළමයි නූපදති.''

මෙවැනි වෙනත් උදාහරණ ද දක්වමින් පරිසරයේ වෙනස් වීමත් සමග ගම ද එහි වාසය කරන මිනිසුන් ද පිරිහී යන ආකාරය මනාව විස්තර විය යුතු ය.

**ප්‍රශ්න අංකය 06**

**6.** අජීවී වස්තූන්ට සජීවත්වයක් ආරෝපණය කිරීම 'ගංගාවේ සංගීතය' පැදි පෙළ රසවත් කාව්‍ය නිර්මාණයක් වීමට හේතු වී ඇත. උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

අජීවී වස්තූන්ට සජීවත්වයක් ආරෝපණය කිරීම :-

★ ගංගාව කාන්තාවක (බිරිඳක) ලෙස නිරූපණය කර තිබීම

★ ආමන්ත්‍රණශීලී භාෂා ව්‍යවහාරය

නිදසුන් ලෙස ඉදිරිපත් කළ හැකි කවි පහත දැක්වේ.

'' සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි

'' ඇඹරෙමි - එහෙත් පසු නොබසිමි - නොනවතිමි ''

" සංගීතවත් වී යම් ඉදිරියට ගලා"
" ඔබ කුමකට ද මා දුටු තැන විමසන්නේ "

" හිරිමල් සිනා රළි පෙණ පිඬු මිහිරිතම"
"ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම"
" ළය යට සසල බව මින් මතු නොනැගෙද්දෙන්"
" කොඳුරමි කෙදිරියක් මුළු ලොව නිසල කොට"

ආදි අදාළ පද්‍ය පාඨ යොදමින් විස්තර සහිත ව ලියා තිබෙන පිළිතුරක් සාර්ථක පිළිතුරක් සේ පිළිගන්න.

**ප්‍රශ්න අංකය 07**

7. දැඩි චිත්ත ධෛර්යයෙන් යුත් අයෙකු ලෙස උග්ගසේන සිටුපුත් චරිතය නිරූපණය වේ. සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

දැඩි චිත්ත ධෛර්යයෙන් යුත් උග්ගසේන චරිතය :-

★ විවාහය සම්බන්ධයෙන් ඔහු ගත් දැඩි තීරණය කෙසේ හෝ ඉටු කර ගැනීම

★ සිටු පුතකු ලෙස තමා මින් පෙර නොවිඳි අද්දැකීම් විඳ ගනිමින් විවාහ ජීවිතයට ඔරොත්තු දෙන අයුරු

★ බිරිඳගේ අපහාස විඳ දරා ගැනීම

★ බිරිඳගේ අපහාස හේතුවෙන් කලකිරීමට පත් ව ඉතා කෙටි කලකින් ශිල්ප ඉගෙන ගැනීම

★ හුණදඬු අග්ගිස්සෙහි සිටිමින් ශිල්ප දැක්වීම

★ රහත් බවට පත්වීම

ආදි අදාළ කරුණු ඉදිරිපත් කරමින් උග්ගසේන සිටුපුත් චරිතයේ චිත්ත ධෛර්යය මතුවන අවස්ථා විස්තර කර ලියා තිබෙන සාර්ථක පිළිතුරකට ඉහළ ලකුණු පිරිනමන්න.

❖ **5, 6, 7 පිළිතුරු සඳහා උදාහරණ 3ට** **ලකුණු 03 යි.**
**සමස්ත විස්තරයට ලකුණු** **ලකුණු 07 යි.**
**මුළු ලකුණු 10 යි.**